**වෙරළ ආරක්ෂක ත්‍යාග අරමුදල - 2025**

**------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

වෙරළ ආරක්ෂක ත්‍යාග අරමුදලේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1988 අංක 64 හා 2011 අංක 49 දරන පනත් මඟින් සංශෝධිත 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමණාකරණ පනතේ 31 (ඊ) (2) වගන්ති ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2025 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සහ ඊට අදාළ විගණන සාක්ෂි ලබා ගැනීමට අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් ඉක්මවා යාම වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ නිගමනය පදනම් වී ඇත්තේ මාගේ විගණන වාර්තාවේ දිනය දක්වා ලබා ගත් විගණන සාක්ෂි මතය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අරමුදලේ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති රීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| උපචිත පදනම මත ගිණුම් තැබීමේදී වර්ෂයකට අදාල සියලු ආදායම් හා වියදම් හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් කල යුතු වුවද අරමුදලේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ සමාලෝචිත වර්ෂයට අදාළව ගිණුම්ගත කර තිබූ රු.5,675,549ක ආදායම සහ රු.5,519,212ක වියදම, අධිකරණ හා පොලිස් ස්ථාන වෙතින් ලබාගත හැකිව තිබූ තොරතුරු මත පමණක් පදනම්ව ගිණුම්ගතකර තිබුණි. තවද සමාලෝචිත වර්ෂයට අදාළ මුළු ආදායම සහ වියදම අනාවරණය නොවීම පිළිබද කිසිදු හෙළිදරව් කිරීමක් මූල්‍ය ප්‍රකාශ මඟින් සිදුකර නොතිබුණි. | අධිකරණ අමාත්‍යාංශය මඟින් සියළු මහේස්ත්‍රාත් අධිකරණ වෙත අදාල දඩ මුදල් මෙම දෙපාර්තමේන්තුවට එවීමට කටයුතු කරන ලෙස දැනුම් දී ඇත. පොලිස් නිලධාරීන්ට අදාල ත්‍යාග මුදල් ලබා ගැනීම සඳහා එවිය යුතු ඉල්ලුම්පත් ආකෘතියක්ද ලබා දී ඇත. ඒ අනුව අදාල මුදල් ගෙන්වාගැනීමට හා ගෙවීමට යාන්ත්‍රණයක් සකස් කර තිබුණද අදාල අධිකරණ හා පොලිස් නිලධාරීන් විසින් නිසි පරිදි මුදල් එවීම සහ ත්‍යාග ලබා ගැනීමේ ඉල්ලුම් පත් යොමු නොකිරීම මත ත්‍යාග මුදල් ගෙවීමට හැකියාවක් නොමැති බව දන්වා සිටිමි. | අරමුදලට අදාළ සියලු ආදායම් හා වියදම් කාලීනව සහ සම්පූර්ණව හඳුනාගෙන වාර්තා කිරීම සඳහා විධිමත් ගිණුම්කරණ හා වාර්තාකරණ ක්‍රමවේදයක් ස්ථාපිත කළ යුතු අතර, මූල්‍ය ප්‍රකාශනවල සම්පූර්ණතාවය තහවුරු කිරීමට අවශ්‍ය පාලන ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කළ යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 264 | ආරම්භයේ සිටම ත්‍යාග මුදල් ප්‍රදානය කරන ලද කිසිදු නිලධාරියකුගෙන් එම මුදල් ලද බවට තහවුරු ලබා ගැනිමේ ක්‍රමවේදයක් ස්ථාපිත කර නොතිබුණි. | ත්‍යාග අරමුදල් ප්‍රදානය කිරීමේදී නිලධාරීන් විසින් අප වෙත එවනු ලබන තොරතුරු මත පදනම්ව ගෙවීම් සිදු කරනු ලබන අතර ආයතනය විසින් අදාල පොලීසි වෙත මුදල් ලැබුනේද යන්න පිළිබඳව තහවුරු ලේඛනයක් එවන ලෙස දැනුම් දී තිබුණද තවමත් ඒ සඳහා කිසිවෙකු ප්‍රතිචාර දක්වා නොමැත. නැවතත් ඒ පිළිබඳව නිලධාරීන් දැනුවත් කර අවශ්‍ය කටයුතු සිදු කරන බව දන්වමි. | ත්‍යාග මුදල් ගෙවීම් සඳහා ප්‍රතිලාභීන්ගේ අත්සන් සහිත ලැබීම් තහවුරු කිරීම් හෝ වෙනත් විධිමත් තහවුරු කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතුය |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 395(ඇ) | අරමුදලේ ජංගම බැංකු ගිණුමට අදාළව 2025 ජනවාරි සිට නොවැම්බර් දක්වා බැංකු සැසඳුම් ප්‍රකාශන පිළියෙළ කර නොතිබුණි. | විගණන නිරීක්ෂණයට පිළිතුරු ලබා දි නොමැත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව මාසිකව බැංකු සැසඳුම් ප්‍රකාශන පිළියෙළ කර වෙනස්කම් කඩිනමින් හඳුනාගෙන නිවැරදි කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 156,337 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තයක් හෝ ඌනතාවයක් නොවිය. පරිපාලන කටයුතු වෙනුවෙන් වෙන් කර තිබූ මුදල් වැය කර නොතිබීම සමාලෝචිත වර්ෂයේ අතිරික්තයක් ඇතිවීමට හේතු වී තිබුණි

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2017 මැයි 09 දිනැති අංක 2018/11 දරන | 1981 අංක 57 දරණ වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ පනත | සුදුසුකම්ලත් ප්‍රතිලාභීන් කඩිනමින් හඳුනාගෙන |

| | | | |
|---|---|---|---|
| | අතිවිශේෂ ගැසට් පත්‍රයේ ඡේද අංක (4) ප්‍රකාරව උසාවි නියෝග මත ලැබෙන දඩ මුදලින් ත්‍යාග සඳහා වෙන් කරන ලද සියයට 50 ක මුදල ත්‍යාග සඳහා සුදුසුකම් ලද පුද්ගලයන්ට ගෙවීම් සිදු කළ යුතු වුවද 2021 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා ත්‍යාග සඳහා වෙන් කරතිබූ රු.1,165,405 ක්ද 2025 වර්ෂයට අදාළ ව රු 1,585,275 ක්ද අදාළ පුද්ගලයන් හඳුනාගෙන ගෙවීමට කටයුතු කර නොතිබුණි. ඒ අනුව 2025 දෙසැම්බර් 31 දිනට ත්‍යාග ලෙස පුද්ගලයන්ට ගෙවිය යුතු මුළු ශේෂය රු 2,750,680 ක් විය. මේ හේතුවෙන් ත්‍යාග අරමුදල පවත්වාගෙන යාමේ අරමුණු නිසි පරිදි ඉටුවන්නේද යන්න ගැටළු සහගත විය. | අනුව පොලීසිය විසින් අනවසර සංවර්ධන කාර්යයන් සඳහා නඩු පවරනු ලබයි. එබැවින් සෑම මාසයක් අවසානයේ තමන් පැවරූ නඩු සඳහා ත්‍යාග ලබා ගැනීමට අදාල අයදුම්පත යොමු කරන ලෙස පොලිස් ස්ථාන වෙත දැනුම් දී ඇත. තවද අදාල මහේස්ත්‍රාත් අධිකරණ වෙත අදාල දඩ මුදල් මෙම අරමුදලට බැර කරන ලෙස දන්වා ඇත. ඒ අනුව අදාල දඩ මුදල් නිසි පරිදි එවීම මත හා නඩු පැවරූ පොලීසි මඟින් නිසි තොරතුරු ලබා දීම මත ත්‍යාග මුදල් ගෙවීම සිදුවේ. ඒ අනුව අරමුණ නිසි පරිදි ඉටු වන අතර අදාල නාම ලේඛන පොලීසි විසින් එවීම සිදු නොකරනු ලබනවිට ත්‍යාග සඳහා මුදල් තිබුනද ගෙවීමට හැකියාවක් නොමැත. | අරමුදලේ අරමුණු අනුව ත්‍යාග මුදල් ගෙවීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | වෙරළ කලාපයේ අනවසර සංවර්ධන ක්‍රියාකාරකම් අවම කිරීම සඳහා පොලිස් නිලධාරීන් හා රජයේ අනෙකුත් නිලධාරීන් මැදිහත් වී ක්‍රියා කිරීම තුලින් අධිකරණය වෙත එක්රැස් වන දඩ මුදල් අදාල නිලධාරීන් වෙත බෙදා හැරීම සඳහා එම මුදල් වෙරළ ආරක්ෂණ ත්‍යාග අරමුදල වෙත එක් රැස් කර ගත හැකි වන පරිදි හා කඩිනමින් සම්බන්ධ පාර්ශවයන්ට බෙදාදීමට හැකිවන පරිදි දිවයිනේ අධිකරණ පද්ධතිය, පොලිස් | අධිකරණ අමාත්‍යාංශ මඟින් සියළු මහේස්ත්‍රාත් අධිකරණ වෙත අදාල දඩ මුදල් මෙම දෙපාර්තමේන්තුවට එවීමට කටයුතු කරන ලෙස දැනුම් දී ඇති අතර අදාල දඩ මුදල් මෙම දෙපාර්තමේන්තුවට බැර විය යුතු බව වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කලමනාකරණ පනතේද දක්වා ඇත. තවද පොලිස් නිලධාරීන්ට අදාල ත්‍යාග මුදල් ලබා ගැනීම සඳහා එවිය යුතු ඉල්ලුම් ආකෘතියක්ද ලබා දී ඇත. ඒ අනුව අදාල මුදල් | තොරතුරු හුවමාරුව, දඩ මුදල් එකතු කිරීම හා ත්‍යාග ගෙවීම් සම්බන්ධයෙන් ආයතන අතර විධිමත් සම්බන්ධීකරණ හා වාර්තාකරණ යාන්ත්‍රණයක් ස්ථාපිත කළ යුතුය. |

| | |
|---|---|
| ස්ථාන හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව අතර විධිමත් යාන්ත්‍රණයක් ක්‍රියාත්මක වී නොතිබිණි. මෙම ආයතන වලින් තොරතුරු ලබාගැනීමට හා යාවත්කාලීන කිරීමට අරමුදලේ පවතින අභ්‍යන්තර පාලනය සතුටුදායක නොවුණි. | ගෙන්වාගැනීමට හා ගෙවීමට යාන්ත්‍රණයක් සකස් කර තිබුණද අදාල අධිකරණ හා පොලිස් නිලධාරීන් විසින් නිසි පරිදි මුදල් එවීම සහ ත්‍යාග ලබා ගැනීමේ ඉල්ලුම් පත් යොමු නොකිරීම මත ත්‍යාග මුදල් ගෙවීමට හැකියාවක් නොමැති බව දන්වා සිටිමි. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ **සභාගත කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 1/2020 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය මඟින් සංශෝධිත මුදල් රෙගුලාසි 877 (2) (ඉ) වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 150 ක් ගත වීමට පෙර වාර්ෂික කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කල යුතු වුව ද ආරම්භයේ සිටම එම වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කර නොතිබුණි. | පෙර වර්ෂ වලදී වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල නොකරන ලද අතර 2024 වර්ෂයේ සිට එය සිදු කරන ලදී. එබැවින් ඉදිරියේදී වාර්ෂික කාර්ය සාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කරනු ලබන බව දන්වා සිටිමි. | චක්‍රලේඛ ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව නියමිත කාලසීමාව තුළ පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කළ යුතුය. |